සියලුම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2018

# 25B - යුරෝපා ඉතිහාසය

## ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
පරීක්ෂක සාකච්ඡා පැවැත්වෙන අවස්ථාවේදී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# 25B - යුරෝපා ඉතිහාසය

## ලකුණු බෙදී යාමේ ආකාරය

| | | | | |
|---|---|---|---|---|
| I පත්‍රය | ▪ | 01 x 40 | = | 40 |
| II පත්‍රය | | | | |
| | | අනිවාර්ය පළමු ප්‍රශ්නයට ලකුණු | = | 18 |
| | | සෙසු ප්‍රශ්න 3 කට 14 බැගින් | = | 42 |
| | | II පත්‍රය අවසාන ලකුණු | = | 60 |
| | | අවසාන ලකුණු | = | 40 + 60 = 100 |

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න.

   ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ............................................................
............................................................ √ △ $\frac{4}{5}$
............................................................

(ii) ............................................................
............................................................ √ △ $\frac{3}{5}$
............................................................

(iii) ............................................................
............................................................ √ △ $\frac{3}{5}$
............................................................

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.

2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.
3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

## ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

## ලකුණු ලැයිස්තු සකස් කිරීම :

මෙවර සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රයට අදාළ ලකුණු ලකුණු ලැයිස්තුවේ "I වන පත්‍රය" තීරුවේ ඇතුළත් කර අකුරෙන් ද ලියන්න. අදාළ විස්තර ලකුණු ඇතුළත් කර "II වන පත්‍රය" තීරුවේ II පත්‍රයේ අවසාන ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

***

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

| | | |
|---|---|---|
| ඉතිහාසය | II | (I කොටස) |
| வரலாறு | II | (பகுதி I) |
| History | II | (Part I) |

**25-B** **S** **II**

**2018.08.23 / 0830 - 1140**

**පැය තුනයි**
*மூன்று மணித்தியாலம்*
*Three hours*

| | |
|---|---|
| **අමතර කියවීම් කාලය** | **- මිනිත්තු 10 යි** |
| மேலதிக வாசிப்பு நேரம் | - 10 நிமிடங்கள் |
| Additional Reading Time | - 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**යුරෝපා ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1989 දක්වා**

**විභාග අංකය:** ........................................

**උපදෙස්:**

* මෙම කොටසේ ප්‍රශ්න **40** ක් ඇත. **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
* එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර **පහ** බැගින් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ **එකක්** පමණි. එම නිවැරදි පිළිතුර තෝරා, දී ඇති **උපදෙස් පරිදි ලකුණු කරන්න.**
* මෙම කොටසට ලකුණු **40** ක් දෙනු ලැබේ.
* කොටස් **දෙකට ම** මුළු කාලය **පැය තුනකි.** පිළිතුරු ලියා අවසන් වූ පසු, **I කොටස, II කොටසේ** පිළිතුරු පත් සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

● අංක **1** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නොගැළපේ.** එම **නොගැළපෙන** නම කුමක් දැ'යි හඳුනාගෙන එහි **අංකය වරහන තුළ** ලියන්න.

**1.** (1) ටයිබර් (2) තේම්ස් (3) ටාගුස්
(4) විස්ටියුලා (5) කීල් (.........)

**2.** (1) තීබ්ස් (2) මෙගාර (3) මර්මරා
(4) කොරින්ත් (5) මිලේටස් (.........)

**3.** (1) ඇලෙක්සැන්ඩර් (2) ට්‍රාජන් (3) හේඩ්‍රියන්
(4) ඇන්ටොනිනස් පියුස් (5) මාර්කස් අවුරේලියස් (.........)

**4.** (1) හොරස් (2) ඔවිඩ් (3) ලිවි
(4) ටැසිටස් (5) ඇලරික් (.........)

**5.** (1) යුදෙව්වෝ (2) විසිගොත්වරු (3) ඔස්ට්‍රාගොත්වරු
(4) ඇන්ග්ලෝ-සැක්සන්වරු (5) වැන්ඩල්වරු (.........)

**6.** (1) බොලොඤ්ඤා (2) ලයිසියම් (3) පැරිස්
(4) ඔක්ස්ෆඩ් (5) කේම්බ්‍රිජ් (.........)

**7.** (1) නාවික හෙන්රි (2) ජොලියට් (3) ලා සලෙ
(4) මාර්ක්වෙටේ (5) හෙන්රි හඩ්සන් (.........)

**8.** (1) ජෝන් වයික්ලිෆ් (2) ජෝන් හස් (3) උල්රිච් ස්විංලි
(4) ජෝන් ටෙට්සල් (5) ජෝන් කැල්වින් (.........)

**9.** (1) චාල්ස් ටවුන්ෂෙන්ඩ් (2) ජෝර්ජ් වොෂිංටන් (3) ජෝන් ඇඩම්ස්
(4) තෝමස් ජෙෆර්සන් (5) ඇන්ඩෘ ජැක්සන් (.........)

**10.** (1) අරාබි ලීගය
(2) එක්සත් ජාතීන්ගේ සංවිධානය (UNO)
(3) පෙට්‍රෝලියම් නිර්යාත කරන රටවල සංවිධානය (OPEC)
(4) යුරෝපීය ආර්ථික ප්‍රජාව (EEC)
(5) මධ්‍යම ගිවිසුම් සංවිධානය (CENTO) (.........)

● අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට **නොගැළපේ**. එම **නොගැළපෙන** යුගලය කුමක් දැ'යි හඳුනාගෙන, ඊට අදාළ **අංකය**, ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**11.** (1) පෙලපොනීසියානු යුද්ධය - ඇතන්ස් සහ ස්පාර්ටා
(2) පියුනික් යුද්ධ - රෝමය සහ කාර්තේජය
(3) සියක් අවුරුදු යුද්ධය - එංගලන්තය සහ ප්‍රංශය
(4) හත් අවුරුදු යුද්ධය - එංගලන්තය සහ ප්‍රශියාව
(5) රෝස යුද්ධ - ලැන්කැස්ටර් හා යෝර්ක් (.........)

**12.** (1) ප්ලේටෝ - ජනරජය (The Republic)
(2) ඇරිස්ටෝටල් - දේශපාලනය (Politics)
(3) ශාන්ත ඔගස්ටීන් - දෙවියන්ගේ නගරය (The City of God)
(4) ශාන්ත තෝමස් ඇක්වයිනාස් - සුම්මා තියලොජිකා
(5) මාටින් ලූතර් - ක්‍රිස්තියානි ආගමේ ආයතන (Institutes of the Christian Religion) (.........)

**13.** (1) හැප්ස්බර්ග් - එංගලන්තය
(2) ටියුඩර් - එංගලන්තය
(3) ස්ටුවර්ට් - එංගලන්තය
(4) හැනෝවර් - එංගලන්තය
(5) වින්ඩ්සර් - එංගලන්තය (.........)

**14.** (1) ස්ටාර් චේම්බර් - හත්වන හෙන්රි
(2) අධර්ම මර්දනාධිකරණය - අටවන හෙන්රි
(3) අනභිභවනීය නාවික හමුදාව - දෙවන පිලිප්
(4) ලෙත්‍රෙ ද කැචේ (විභාගයකින් තොරව යමෙකු බන්ධනාගාරගත කිරීමේ ආඥාව) - දහතුන්වන ලුවි
(5) මහාද්වීපික ක්‍රමය - නැපෝලියන් බොනපාර්ට් (.........)

**15.** (1) බර්තොලමියු ඩයස් - අප්‍රිකාවේ දකුණු තුඩුවට යාත්‍රා කිරීම
(2) වස්කෝ ද ගාමා - කැලිකට් වෙත යාත්‍රා කිරීම
(3) ක්‍රිස්ටෝෆර් කොලම්බස් - කැරිබියන් දූපත්වලට ගොඩ බැසීම
(4) ෆ්‍රැන්සිස් ඩ්‍රේක් - මෙක්සිකෝව යටත් කිරීම
(5) ෆ්‍රැන්සිස්කෝ පිසාරෝ - පේරු යටත් කිරීම (.........)

● අංක **16** සිට **25** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් **X** සහ **Y** තීරවල දී ඇත. **Y** තීරයේ ඇති නාම / ප්‍රකාශන / දින වකවානු **X** තීරයේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නොවේ**. **Y** තීරය, **X** තීරය සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන තුළ** ලියන්න.

**16.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | ක්ලිස්තිනීස් | A | වෛද්‍ය විද්‍යාවේ පියා |
| (ii) | හෙරඩෝටස් | B | 'විද්‍යාත්මක' සමාජවාදයේ ආරම්භකයා |
| (iii) | හිපොක්‍රටීස් | C | මානවවාදයේ පියා |
| (iv) | පෙට්‍රාක් | D | ඇතීනියානු ප්‍රජාතන්ත්‍රවාදයේ පියා |
| (v) | කාල් මාක්ස් | E | ඉතිහාසයේ පියා |

(1) BEACD (2) CEABD (3) DCEAB (4) DEACB (5) EDACB (.........)

**17.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | ප්ලේටෝ | A | "කුමාරයා, සිංහයා සහ හිවලා අනුකරණය කළ යුතු ය.' |
| (ii) | ඇරිස්ටෝටල් | B | "වැඩිම සංඛ්‍යාවකගේ වැඩිම සතුට" |
| (iii) | මැකියාවෙලී | C | 'බලතල පංගු කිරීමේ න්‍යාය' |
| (iv) | මොන්ටෙස්කිව් | D | "මිනිසා දේශපාලන සත්ත්වයෙකි." |
| (v) | ජෙරමි බෙන්තම් | E | "දාර්ශනිකයෝ පාලකයන් විය යුත්තාහ." |

(1) BEACD (2) CEABD (3) DCEAB (4) DEACB (5) EDACB (.........)

**18.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | මිලාන් ආඥාව | A | පාලනය කරන්නේ යමෙක් ද ඔහුගේ ආගම රටවැසියාගේ ද ආගම විය යුතු ය. |
| (ii) | නැන්ටීස් ආඥාව | B | කතෝලික ආගම ප්‍රංශයේ බහුතරයකගේ ආගම ලෙස පිළිගැනීම |
| (iii) | ඔග්ස්බර්ග් සාම ගිවිසුම | C | ක්‍රිස්තු භක්තිකයන්ට ආගමික නිදහස ප්‍රදානය කිරීම |
| (iv) | 1801 කොන්කෝඩට් සම්මුතිය | D | වතිකානුව ස්වෛරී රාජ්‍යයක් ලෙසත්, කතෝලික ආගම ඉතාලියේ රාජ්‍ය ආගම ලෙසත් පිළිගැනීම |
| (v) | ලැටරන් ගිවිසුම | E | ප්‍රංශයේ ප්‍රොතෙස්තාන්තවාදීන්ට ආගමික නිදහස ප්‍රදානය කිරීම |

(1) BEACD (2) CEABD (3) DCEAB (4) DEACB (5) EDACB (.........)

**19.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | ම්ලේච්ඡ ආක්‍රමණ | A | ප්‍රංශ විප්ලවය |
| (ii) | කොන්ස්තන්තිනෝපලයේ වැටීම | B | බටහිර රෝම අධිරාජ්‍යයේ බිඳවැටීම |
| (iii) | මූල්‍ය අර්බුදය සහ එස්ටේට්ස් ජෙනරල් සභාව කැඳවීම | C | පළමුවන ලෝක යුද්ධය |
| (iv) | සරයේවෝහි ඝාතනය | D | දෙවන ලෝක යුද්ධය |
| (v) | ජර්මනිය විසින් පෝලන්තය ආක්‍රමණය කිරීම | E | පුනරුදය |

(1) BEACD (2) CEABD (3) DCEAB (4) DEACB (5) EDACB (.........)

**20.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | කැල්වින්වාදීහු | A | එංගලන්තය |
| (ii) | හියුගනෝවරු | B | ඕලන්දය |
| (iii) | පියුරිටන්වරු | C | ස්කොට්ලන්තය |
| (iv) | ප්‍රෙස්බිටීරියන්වරු | D | ස්විට්සර්ලන්තය |
| (v) | රෙපරමාදු පල්ලියේ සාමාජිකයෝ | E | ප්‍රංශය |

(1) BEACD (2) CEABD (3) DCEAB (4) DEACB (5) EDACB (.........)

**21.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | රොබට් වොල්පෝල් | A | ප්‍රංශයේ පස්වැනි සමූහාණ්ඩුවේ පළමුවන ජනාධිපතිවරයා |
| (ii) | මාර්ෂල් ටිටෝ | B | සෝවියට් දේශයේ අවසාන ජනාධිපතිවරයා |
| (iii) | කොන්රඩ් ඇඩිනුවර් | C | යුගෝස්ලාවියාවේ ජනාධිපතිවරයා |
| (iv) | චාල්ස් ඩි ගෝල් | D | එංගලන්තයේ ප්‍රථම අගමැතිවරයා |
| (v) | මිහායල් ගොර්බචොෆ් | E | ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුවේ ප්‍රථම චාන්සලර්වරයා |

(1) BEACD (2) CEABD (3) DCEAB (4) DEACB (5) EDACB (.........)

| | X | Y |
|---|---|---|
| 22. | (i) ලිගුරියන්, සිසැල්පයින් හා පාර්තිනෝපියන් සමූහාණ්ඩු | A මැසිනි |
| | (ii) 'හුදු භූගෝලීය ප්‍රකාශයක් පමණකි.' | B නැපෝලියන් බොනපාර්ට් |
| | (iii) තරුණ ඉතාලිය | C ගැරිබෝල්ඩි |
| | (iv) රතු කමිස හමුදාව | D දෙවන වික්ටර් එමැනුවෙල් රජතුමා |
| | (v) එක්සත් කරන ලද ඉතාලිය | E මෙටර්නික් |

(1) BEACD (2) CEABD (3) DCEAB (4) DEACB (5) EDACB (.........)

| | X | Y |
|---|---|---|
| 23. | (i) වර්සායි ගිවිසුම | A බල්ගේරියාව |
| | (ii) ශා. ජර්මේන් ගිවිසුම | B තුර්කිය |
| | (iii) නියුලි ගිවිසුම | C හංගේරියාව |
| | (iv) ට්‍රියනොන් ගිවිසුම | D ජර්මනිය |
| | (v) ලොසැන් ගිවිසුම | E ඔස්ට්‍රියාව |

(1) BEACD (2) CEABD (3) DCEAB (4) DEACB (5) EDACB (.........)

| | X | Y |
|---|---|---|
| 24. | (i) එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) | A වොෂිංටන් |
| | (ii) එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය (UNESCO) | B වියානා |
| | (iii) ලෝක බැංකුව | C ජිනීවා |
| | (iv) ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) | D පැරිස් |
| | (v) අන්තර්ජාතික න්‍යෂ්ටික බල ඒජන්සිය (IAEA) | E නිව්යෝර්ක් |

(1) BEACD (2) CEABD (3) DCEAB (4) DEACB (5) EDACB (.........)

| | X | Y |
|---|---|---|
| 25. | (i) ට්‍රිග්වි ලී | A බුරුමය |
| | (ii) ඩැග් හැමර්ෂල් | B ඔස්ට්‍රියාව |
| | (iii) ඌ තාන් | C නෝර්වේ |
| | (iv) කුර්ට් වෝල්ඩ්හයිම් | D පේරු |
| | (v) පෙරේස් ඩී කුවෙලා | E ස්වීඩන් |

(1) BEACD (2) CEABD (3) DCEAB (4) DEACB (5) EDACB (.........)

- අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති **(A), (B), (C)** සහ **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක් හෝ කිහිපයක් හෝ** නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,

**(A)** සහ **(B)** පමණක් නිවැරදි නම් ........................................ **1** ද,
**(B)** සහ **(C)** පමණක් නිවැරදි නම් ........................................ **2** ද,
**(C)** සහ **(D)** පමණක් නිවැරදි නම් ........................................ **3** ද,
**(A)** සහ **(C)** පමණක් නිවැරදි නම් ........................................ **4** ද,
ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට වැඩි** සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් ............ **5** ද **වරහන තුළ** ලියන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| **(A)** සහ **(B)** පමණක් නිවැරදි ය. | **(B)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(C)** සහ **(D)** පමණක් නිවැරදි ය. | **(A)** සහ **(C)** පමණක් නිවැරදි ය. | ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට වැඩි** සංඛ්‍යාවක් හෝ නිවැරදි ය. |

**26. පහත දැක්වෙන්නන් අතුරෙන් ඇතැන්ස් රාජ්‍යයේ පාලකයෝ කවරහු ද?**

(A) සෝලෝන් (B) සර්ක්සීස්
(C) පෙරික්ලීස් (D) හැනිබාල් (.........)

**27. පහත දැක්වෙන්නන් අතුරෙන් රෝම අධිරාජයෝ කවරහු ද?**

(A) ජුලියස් සීසර් (B) පොම්පේ
(C) ඔගස්ටස් (D) තියඩෝසියස් (.........)

**28. වැඩවසම් ක්‍රමය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**

(A) මධ්‍යකාලීන යුරෝපයේ පැවති දේශපාලන හා සමාජ-ආර්ථික ක්‍රමය වැඩවසම් ක්‍රමය ලෙස හඳුන්වනු ලැබේ.
(B) වැඩවසම් ආර්ථිකය කෘෂිකර්මාන්තය පදනම් කොටගෙන පැවතුණි.
(C) වැඩවසම් රාජ්‍යවල ශක්තිමත් මධ්‍යම ආණ්ඩුවක් පැවතුණි.
(D) රජවරුන් සතුව ශක්තිමත් ස්ථාවර හමුදා තිබුණි. (.........)

**29. පහත දැක්වෙන කරුණු අතුරෙන් ප්‍රතිරෙපරමාදුවේ ප්‍රධාන අංග කවරේ ද?**

(A) ජර්මනියේ ලූතර්වාදී පල්ලිය (B) ජේසු සංගමය
(C) ට්‍රෙන්ට් සංගායනාව (D) කතෝලික සංගමය (.........)

**30. සීතල යුද්ධය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**

(A) ඇමෙරිකා එක්සත් ජනපදය හා සෝවියට් දේශය මුල් කොටගත් බල කඳවුරු දෙක අතර පැවැති දෘෂ්ටිවාදීමය, දේශපාලන හා රාජ්‍ය තාන්ත්‍රික අරගලයයි.
(B) 1949 දී උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානය පිහිටුවීම
(C) 1955 දී වෝර්සෝ සම්මුතිය අත්සන් කිරීම
(D) 1989 දී යුද්ධය අවසන් වී යැයි සාමාන්‍යයෙන් සලකනු ලැබේ. (.........)

● අංක **31** සිට **35** තෙක් සෑම ප්‍රශ්නයක ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට **නොගැළපේ. එම නොගැළපෙන** කරුණ තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**31. කාර්මික විප්ලව සමයේ ප්‍රධාන නව නිපැයුම්**

(1) සුළං මෝල (2) දුවන නඩාව (3) ස්පිනිං ජෙනිය
(4) ජල රාමුව (5) වාෂ්ප එන්ජිම (.........)

**32. ප්‍රංශ විප්ලවය හා සම්බන්ධ ප්‍රධාන සිදුවීම්**

(1) ටෙනිස් පිටියේ දිවුරුම (2) බොස්ටන් තේ සාදය
(3) බැස්ටීලය බිඳ දැමීම (4) මිනිස් හා පුරවැසි අයිතිවාසිකම් ප්‍රකාශනය
(5) දහසයවන ලුවී රජතුමා මරණයට පත් කිරීම (.........)

**33. වියානා සම්මේලනයට සහභාගී වූ ප්‍රධාන නායකයන්**

(1) ඔස්ට්‍රියාවේ මෙටර්නික් (2) ප්‍රශියාවේ හාර්ඩන්බර්ග්
(3) බ්‍රිතාන්‍යයේ කාසල්රී (4) රුසියාවේ පළමුවන සාර් ඇලෙක්සැන්ඩර් රජතුමා
(5) සාර්ඩිනියාවේ කැවූර් (.........)

**34. දෙවන ලෝක යුද්ධය ඇති වීමට තුඩු දුන් හේතු**

(1) වර්සායි ගිවිසුමේ අඩුපාඩු (2) ඉතාලිය තුළ ෆැසිස්ට්වාදය නැගී ඒම
(3) ජර්මනිය තුළ නාට්සිවාදය නැගී ඒම (4) රුසියානු - තුර්කි යුද්ධය හා බෝල්කන් අර්බුදය
(5) අවි ආයුධ තරගය (.........)

**35. සෝවියට් දේශයේ පාලකයන්**

(1) නිකිතා කෘෂෙෆ් (2) ඇලෙක්සි කොසිගින් (3) යූරි ගගාරින්
(4) ලියොනිඩ් බ්‍රෙෂ්නෙෆ් (5) අන්ද්‍රපොෆ් (.........)

● අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලය දැ'යි තෝරා ඊට අදාළ **අංකය වරහන තුළ** ලියන්න.

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| **1** | නිවැරදි ය. | වැරදි ය. |
| **2** | නිවැරදි ය. | නිවැරදි ය. |
| **3** | වැරදි ය. | වැරදි ය. |
| **4** | වැරදි ය. | නිවැරදි ය. |
| **5** | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| **36.** | පර්සියානුවන්ට එරෙහිව කරන ලද ග්‍රීක යුද්ධ පදනම් කරගෙන හෝමර් සිය වීර කාව්‍ය රචනා කළේ ය. | රෝම රාජ්‍ය තාන්ත්‍රිකයකු වූ සිසරෝ 'කුමාරයා' නම් ග්‍රන්ථයේ කතුවරයා ය. | (.........) |
| **37.** | හතරවන සියවසේ ආරම්භය දක්වා රෝම අධිරාජයෝ ක්‍රිස්තියානි ආගම අතුගා දැමීමේ අරමුණින් ක්‍රිස්තියානි භක්තිකයින්ට විරුද්ධව වරින්වර වධහිංසා කිරීම්වල යෙදුනාහ. | කොන්ස්ටන්ටයින් අධිරාජයා විසින් නැගෙනහිර හා බටහිර යනුවෙන් රෝම අධිරාජ්‍යය කොටස් දෙකකට බෙදනු ලැබී ය. | (.........) |
| **38.** | වාණිජවාදයේ ප්‍රධාන ලක්ෂණයක් නම් ආර්ථික කටයුතුවලට රජය මැදිහත් වීමයි. | වෝල්ටෙයාර් විසින් මුලින්ම වාණිජවාදී න්‍යාය ඉදිරිපත් කරන ලදී. | (.........) |
| **39.** | වෙස්ට්ෆේලියා සාම ගිවිසුම නූතන යුරෝපා ඉතිහාසයේ ආගමික හා දේශපාලන යන දෙඅංශයෙහිම සන්ධිස්ථානයක් සලකුණු කරයි. | ආගමික යුද්ධය අවසන් කළ වෙස්ට්ෆේලියා සාම ගිවිසුම, යුරෝපයේ වර්තමාන රාජ්‍ය ක්‍රමය සඳහා පදනම දමන ලදැයි සැලකේ. | (.........) |
| **40.** | ජෝශප් ස්ටාලින් බටහිර රටවල් සමඟ සාමකාමී සහජීවන ප්‍රතිපත්තියක් ආරම්භ කළේ ය. | බර්ලින් තාප්පය කඩා බිඳහෙළීම බටහිර හා නැගෙනහිර ජර්මන් රාජ්‍යවල එක්සත්භාවයට මඟ පෑදී ය. | (.........) |

* *

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
## இலங்கைப் பரீட்சைத் திணைக்களம்

### අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2018

විෂය අංකය / பாட இலக்கம்: 25 B

විෂයය / பாடம்: යුරෝපා ඉතිහාසය

### ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

### I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 5 | 11. | 4 | 21. | 3 | 31. | 1 |
| 02. | 3 | 12. | 5 | 22. | 1 | 32. | 2 |
| 03. | 1 | 13. | 1 | 23. | 4 | 33. | 5 |
| 04. | 5 | 14. | 2 | 24. | 5 | 34. | 4 |
| 05. | 1 | 15. | 4 | 25. | 2 | 35. | 3 |
| 06. | 2 | 16. | 4 | 26. | 4 | 36. | 3 |
| 07. | 1 | 17. | 5 | 27. | 3 | 37. | 2 |
| 08. | 4 | 18. | 2 | 28. | 1 | 38. | 1 |
| 09. | 1 | 19. | 1 | 29. | 2 | 39. | 5 |
| 10. | 2 | 20. | 4 | 30. | 5 | 40. | 4 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 40 = 40

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]


ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

| | | |
|---|---|---|
| ඉතිහාසය II<br>வரலாறு II<br>History II | 25-B | S |

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. 1

විභාග අංකය / சுட்டெண் / Index No. ..........................



## II කොටස

**1. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න. ඒවායින් කැමති දෙකක් පිළිබඳ ව කෙටි ඓතිහාසික සටහන් ලියන්න.**

**(i) කෝර්සිකා (ii) පිරනීස් (iii) රයින් ගඟ (iv) කළු මුහුද**
**(v) ලන්ඩන් (vi) බර්ලින් (vii) ශාන්ත පීටර්ස්බර්ග් (viii) ස්විට්සර්ලන්තය**

**(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු *01* බැගිනි; කෙටි ඓතිහාසික සටහනකට ලකුණු *05* බැගිනි)**

**2. ග්‍රීක සංස්කෘතියේ ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න.**

❖ **ආගම**

- ස්වභාවික වස්තූන්ට දේවත්වය ආරූඪකොට පුදපූජා පැවැත්වීම ග්‍රීක ආගම ලෙස පුළුල් වශයෙන් සැලකිය හැකිය.
- ග්‍රීකයන් අතර බහුදේවවාදය පැවතීම. සියුස් හෙවත් ආකාශ දෙවියා ප්‍රමුඛකොට ගත් ග්‍රීක දේව මණ්ඩලය.
- දෙවිවරුන් ඔලිම්පස් කන්දේ වාසය කරතැයි විශ්වාස කිරීම.
- ග්‍රීක ආගම නිදහස් චින්තනයට බාධාවක් නොවීම හා එමගින් කලාවන්ගේ දියුණුවට අනුබල ලැබීම.
- ග්‍රීකයන් අතර කිසියම් ආගමික එක්සත්භාවයක් පැවතීම.

❖ **කලාව සහ ගෘහනිර්මාණ ශිල්පය**

- ග්‍රීක කලාව මානවවාදය හා ස්වභාවිකත්වය පිළිබිඹු කිරීම.
- සාමාන්‍ය මිනිසුන්ගේ ප්‍රතිමාද ඇති නමුත් වැඩි වශයෙන් දේව ප්‍රතිමා දක්නට ලැබීම. එම දේව ප්‍රතිමාද මිනිස් ශරීර ලක්ෂණවලින් යුතුව නිර්මාණය කර තිබීම.
- ඇතන්ස් රාජ්‍යයේ ඇක්‍රොපොලිස් කඳු මුදුනේ නිර්මාණය කොට ඇති පාතිනොන් දේවස්ථානය (ඇතීනා දෙවඟනගේ දෙවොල).
- ඩොරික්, ඉයොනික් හා කොරින්තියන් ගෘහනිර්මාණ ශෛලීන්.
- පාතිනොන්හි ඇතීනාගේ ප්‍රතිමාව, සියුස්ගේ දෙවොලේ සියුස්ගේ ප්‍රතිමාව කැපී පෙනෙන නිර්මාණ වේ.
- ප්‍රතිමා - ෆීඩියාස් (ඇතීනා, සියුස්), මයිරන් (කවපෙත්ත විසි කරන්නා), ප්‍රැක්සිටිලීස් ළදරු ඩයනීසස් අතැතිව සිටින හර්මීස්).

❖ **සාහිත්‍යය**

- වීර කාව්‍ය - හෝමර්ගේ ඉලියඩ් හා ඔඩිසි
- ගී කාව්‍ය - පින්ඩාර්ගේ හා සැෆෝගේ නිර්මාණ
- නාට්‍ය
  - ✓ ශෝකාන්ත - ඊස්කිලස්ගේ, සොෆොක්ලීස්ගේ හා යුරිපිඩීස්ගේ නිර්මාණ
  - ✓ සුඛාන්ත (ප්‍රහසන) - ඇරිස්ටොෆනීස්ගේ නිර්මාණ
- ඉතිහාස කෘති - හෙරඩෝටස් (පර්සියානු යුද්ධය), තුසිඩිඩීස් (පෙලපොනීසියානු යුද්ධය)

❖ **දර්ශනය**

- ග්‍රීක ශිෂ්ටාචාර අවධියේ ඉතාමත්ම වැදගත් විෂය ක්ෂේත්‍රය ලෙස සැලකුණේ දර්ශනයයි.
- දර්ශනයට විෂයයන් ගණනාවක් අයත් විය (භෞතික විද්‍යාව, තාරකා විද්‍යාව, තර්ක ශාස්ත්‍රය ආදිය).

- තර්කානුකූලව හා බුද්ධිවාදී ලෙස ස්වභාව ධර්මය හා මානව සමාජය අධ්‍යයනය කිරීමට යත්න දරා තිබීම ග්‍රීක දර්ශනයේ දැකිය හැකි විශේෂ ලක්ෂණයයි.
- මුල්කාලීන - දාර්ශනිකයන් තේලීස්, ඇනෙක්සිමැන්ඩර්, ඇනෙක්සිමීනීස්.
- විතණ්ඩවාදීන්.
- සොක්‍රටීස්, ප්ලේටෝ, ඇරිස්ටෝටල්.

**(ලකුණු 14 යි)**

**3. "පුනරුදය යුරෝපා ශිෂ්ටාචාරයේ වර්ධනයේ සන්ධිස්ථානයක් සලකුණු කරයි."**

**(i) පුනරුදය ආරම්භ වූ රට නම් කරන්න.**

ඉතාලිය

**(ලකුණු 01 යි)**

**(ii) පුනරුදයට අනුග්‍රහ දක් වූ දෙදෙනෙකු නම් කරන්න.**

පවුල් - මිලාන්හි ස්ෆෝර්සා, ෆ්ලොරන්ස්හි මෙඩිචි, ෆරාරාහි එස්ටෙ, මාන්ටුවාහි ගොන්සාගා

පුද්ගලයන් - IV නිකලස්, VI ඇලෙක්සැන්ඩර්, II ජූලියස්, X ලියෝ යන පාප්වරු

**(ලකුණු 02 යි)**

**(iii) පුනරුදය ඇතිවීමට තුඩුදුන් ප්‍රධාන සාධක සැකෙවින් දක්වන්න.**

❖ ඉතාලියේ ආර්ථික, සමාජ හා දේශපාලන පසුබිම
  - වැඩවසම් ක්‍රමයේ පිරිහීම.
  - වෙළඳාම දියුණු වීම, වෙළඳ නගර වර්ධනය වීම, ධනවත් මධ්‍යම පන්තියක් බිහිවීම සහ ඔවුන්ගේ අනුග්‍රහය.
  - ඉතාලියේ පෞර රාජ්‍යවල සිටි ඇතැම් කුමාරවරු සහ ඇතැම් පූජකයන් කලා කටයුතුවලට අනුග්‍රහ දැක්වීම.

❖ පැරණි රෝම ශිෂ්ටාචාරයේ ස්මාරක ශේෂව පැවතීම පුනරුද නිර්මාණ කෙරෙහි බලපෑම.

❖ ඉතාලි විශ්වවිද්‍යාලවල විෂයමාලාවේ දේවධර්මය හැරුණුවිට වෛද්‍ය විද්‍යාව හා නීතිය වැනි ලෞකික විෂයක්ෂේත්‍රවලට වැඩි අවධානයක් දැක්වීම.

❖ 1453 කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කීන් අතට පත්වීම. එහි තිබූ ග්‍රීක-රෝම පොතපත හා දැනුම ඉතාලියට ගලා ඒම.

**(ලකුණු 04 යි)**

**(iv) කලාව හා දේශපාලන දර්ශනය යන ක්ෂේත්‍රවල ඇති වූ ප්‍රබෝධය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් පුනරුදය යුරෝපා ශිෂ්ටාචාරයේ වර්ධනයේ සන්ධිස්ථානයක් සලකුණු කරන්නේ කෙසේ දැයි පරීක්ෂා කරන්න.**

❖ ග්‍රීක හා ලතින් භාෂාවල ප්‍රබෝධයක් ඇතිවීම, භාෂා සහ මානවශාස්ත්‍ර හැදෑරීම වර්ධනය වීම.

❖ මානවවාදයේ නැගී ඒම.

❖ කලාව සම්බන්ධයෙන් ප්‍රබෝධයක් ඇතිවීමඃ ගෘහනිර්මාණ ශිල්පය, ප්‍රතිමා කලාව ග්‍රීක-රෝම සම්ප්‍රදායන්ගේ ආභාෂය ලැබීම.

❖ චිත්‍ර කලාවේ විශාල ප්‍රබෝධයක් ඇතිවීම.

❖ පුනරුද කලාකරුවන්ගේ කෘතීන් උදාඃ ලියනාඩෝ ඩා වින්චිගේ මොනාලිසා, මයිකලාංජෙලෝගේ ඩේවිඩ්.

❖ පුනරුද කලාව ස්වභාවිකත්වයට හා ලෞකිකත්වයට වඩාත් නැඹුරුවීම.

❖ නව දේශපාලන චින්තනයක් ඉදිරියට පැමිණීම - මකියාවෙල්ලි.

**(ලකුණු 07 යි)**

**4. (i) පහළොස්වන හා දහසයවන සියවස්වල යුරෝපයේ ජාතික රාජ්‍ය නැගී ඒමට තුඩුදුන් සාධක කවරේ ද?**

- ❖ වැඩවසම්, දේශපාලන, අර්ථ-සමාජ ක්‍රමයේ පරිහාණිය.
- ❖ මධ්‍යම පන්තියේ නැගීම.
- ❖ ජාතිකත්වය / ජාතිකවාදය නැගී ඒම.
- ❖ පාලකයන්ගේ සුවිශේෂී පෞරුෂය.
- ❖ පුනරුදයේ බලපෑම.
- ❖ රජයේ ස්වරූපය පිළිබඳ සංකල්පය වෙනස්වීම - මකියාවෙල්ලිගේ කුමාරයා කෘතිය.

**(ලකුණු 06 යි)**

**(ii) ජාතික රාජ්‍යවල ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න.**

- ❖ එක් ජාතියකට අයත්, පොදු භාෂාවක් කතා කරන, පොදු සංස්කෘතියකට උරුමකම් කියන, ජනකොට්ඨාශයක් ජීවත්වන, නිශ්චිත දේශසීමාවලින් යුත් දේශපාලන සංවිධානයක් පුළුල් අර්ථයෙන් ගත්විට ජාතික රාජ්‍යයක් ලෙස හැඳින්විය හැකිය.
- ❖ ජාතික එක්සත්භාවය.
- ❖ බලය කේන්ද්‍රගත කරන ලද ශක්තිමත් රාජාණ්ඩුව (නව රාජාණ්ඩු).
- ❖ ශක්තිමත් ස්ථාවර හමුදාව.
- ❖ මධ්‍යම ආණ්ඩුවේ සහ හමුදාවේ කටයුතු පරිපාලනය කළ පුළුල් නිලධාරී තන්ත්‍රය.
- ❖ රජවරුන්ට මධ්‍යම පන්තියේ සහයෝගය ලැබීම හා මධ්‍යම පාන්තිකයන් පාලන කටයුතුවලට සම්බන්ධ කරගැනීම.
- ❖ රදළවරුන්ගේ බලය දුර්වල කිරීම.
- ❖ දේශ ගවේෂණවලට සහයෝගය දීම.

**(ලකුණු 08 යි)**

**5. (i) අමෙරිකානු නිදහස් සටන ඇති වීමට තුඩුදුන් ප්‍රධාන සාධක විග්‍රහ කරන්න.**

❖ **ආර්ථික සාධක**

- ▪ එංගලන්තය උතුරු අමෙරිකාවේ ඉංග්‍රීසි ජනපද විෂයයෙහි අනුගමනය කළ වාණිජවාදී ප්‍රතිපත්තිය.
- ▪ එම ප්‍රතිපත්තිය නාවික පනත් හා වාණිජ නීති මගින් ක්‍රියාවට නැංවීම
  - ✓ මව්රටේ නිපදවන ඇතැම් භාණ්ඩ ජනපදවල නිපදවීම තහනම් කිරීම.
  - ✓ නම් කළ භාණ්ඩ මව්රටට පමණක් අලෙවි කිරීම.
  - ✓ ජනපදවල භාණ්ඩ ප්‍රවාහනයට මව් රටේ නැව් පමණක් යොදාගත යුතුවීම.

❖ **දේශපාලන සාධක**

- ▪ මව්රට ගෙන ගිය මර්දනකාරී බදු ප්‍රතිපත්තියට ක්‍රමයෙන් ජනපදවාසීන් එරෙහි වීම.
- ▪ සත් අවුරුදු යුද්ධයෙන් පසුව ජනපදවලට තවදුරටත් ඉංග්‍රීසි හමුදා ආරක්ෂාව අවශ්‍ය නොවීම.
- ▪ එංගලන්ත පාර්ලිමේන්තුව තවදුරටත් නව බදු පැනවීම හා ඒවා දැඩි ලෙස ක්‍රියාත්මක කිරීම - ටවුන්ෂෙන්ඩ් පනත් (මුද්දර බද්ද, තේ බද්ද).
- ▪ ඇතැම් බදු ජනතා විරෝධය හමුවේ අවලංගු කළ නමුත් මව් රටට ජනපදවලින් බදු අයකිරීමේ අයිතිය ඇති බව අවධාරණය කරමින් එංගලන්ත පාර්ලිමේන්තුව තේ බද්ද අවලංගු කිරීම ප්‍රතික්ෂේප කිරීම.

- විරෝධය දේශපාලන නිදහස ලබාගැනීමේ ඉලක්කයක් දක්වා වර්ධනය වීම ('නියෝජනය නැතිනම් බදුත් නැත').
- බොස්ටන් තේ සාදය.

**(ලකුණු 06 යි)**

**(ii) අමෙරිකානු නිදහස් සටනෙන් උද්ගත වූ ප්‍රතිඵල පරීක්ෂා කරන්න.**

- ❖ අමෙරිකා නිදහස් සටන ජයගැනීමෙන් පසු අමෙරිකා එක්සත් ජනපදය නම් ස්වාධීන රාජ්‍යය පිහිටුවීම.
- ❖ සමූහාණ්ඩුවක් ප්‍රකාශයට පත්කිරීම සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අයිතිවාසිකම් ප්‍රකාශයක් ඇතුළත් කරනු ලැබීම.
- ❖ බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය පාලනයට එරෙහිව සටන්කොට ස්වාධීනත්වය දිනාගත් ප්‍රථම රාජ්‍යය වීම.
- ❖ නිදහස් සටන අවස්ථාවේදීම ස්වාධීනතා ප්‍රකාශය නිකුත් කිරීම.
- ❖ පළමුවන ඉංග්‍රීසි අධිරාජ්‍යයේ අවසානය සලකුණු කිරීම.
- ❖ අමෙරිකානු නිදහස් සටන ප්‍රංශ විප්ලවය ඇතිවීම කෙරෙහි බලපෑම.
- ❖ 19 වන සියවසේ ලතින් අමෙරිකාවේ ස්පාඤ්ඤ සහ පෘතුගීසි ආධිපත්‍යයන්ට එරෙහිව ඇති වූ නිදහස් සටන් කෙරෙහි මෙම විප්ලවය බලපෑම.

**(ලකුණු 08 යි)**

**6. (i) 1815 සිට 1848 දක්වා ජර්මනිය එක්සේසත් කිරීමට එරෙහිව පැවති ප්‍රධාන බාධක ගෙනහැර දක්වන්න.**

- ❖ රාජ්‍ය කොටස් 39 කට බෙදී පැවතීම.
- ❖ ඔසුට්‍රියානු බලය හා බලපෑම.
- ❖ මෙටර්නික් ක්‍රමය.
- ❖ වියනා සම්මේලනයේ තීරණ ක්‍රියාත්මක කිරීමට යුරෝපා රටවල් බැඳී සිටීම.
- ❖ ජාතිකවාදය ප්‍රමාණවත් ලෙස ප්‍රචලිතව නොතිබීම.
- ❖ ජර්මනිය එක්සේසත් කිරීම සඳහා තනි වැඩපිළිවෙලක් වෙනුවට විවිධ ක්‍රියාමාර්ග ඉදිරිපත්වීම.

**(ලකුණු 06 යි)**

**(ii) 1862 සිට 1871 දක්වා ජර්මනිය එක්සේසත් කිරීම සඳහා බිස්මාක් අනුගමනය කළ ක්‍රියාමාර්ගය විවේචනාත්මකව විමසන්න.**

- ❖ 'තත්කාලීන ප්‍රශ්න විසඳනු ලබන්නේ කතා පැවැත්වීමෙන් හෝ බහුතරයකගේ යෝජනා සම්මත කිරීමෙන් හෝ නොවේ; ලෙයින් සහ යකඩෙනි.' යන බිස්මාක්ගේ ප්‍රකාශය 1862 සිට 1871 දක්වා ඔහු අනුගමනය කළ ප්‍රතිපත්තිය කැටිකොට දක්වයි.
- ❖ ප්‍රශියාවේ ලිබරල්වාදීන්ගේ බලය බිඳදැමීම.
- ❖ ප්‍රශියානු හමුදාව ශක්තිමත් කිරීම.
- ❖ 1864 දී ඔසුට්‍රියාව සමග එක්ව ඩෙන්මාර්කය පරාජය කොට ශ්ලෙස්විග් සහ හොල්සිටයින් ප්‍රදේශ අත්පත් කරගැනීම.
- ❖ 1866 දී ඔස්ට්‍රියාව පරාජය කොට ප්‍රශියාවේ නායකත්වය යටතේ උතුරු ජර්මන් සංයුක්තය ගොඩනැගීම.
- ❖ 1870-71 දී ප්‍රංශය පරාජය කොට දකුණු ජර්මන් රාජ්‍ය උතුරු ජර්මන් සංයුක්තයට ඇඳාගෙන ජර්මනිය එක්සේසත් කිරීමේ කාර්යය සම්පූර්ණ කිරීම.

**(ලකුණු 08 යි)**

**7. "යුරෝපය බල කඳවුරු දෙකකට බෙදීම පළමුවන ලෝක යුද්ධය ඇති වීමට තුඩුදුන් ප්‍රධානතම හේතුව විය."**

**(i) පළමුවන ලෝක යුද්ධය ඇති වීමට තුඩුදුන් ආසන්නතම සාධකය කුමක් ද?**

ඔස්ට්‍රියාවේ ඔටුන්න හිමි ෆ්‍රාන්ස් ෆර්ඩිනන්ඩ් ආදිපාදවරයා සහ ඔහුගේ බිසව බොස්නියාවේ සරයේවෝ නගරයේදී සර්බියානු ත්‍රස්තවාදී කණ්ඩායමක් විසින් ඝාතනය කිරීම. **(ලකුණු 01 යි)**

**(ii) එකිනෙකට විරුද්ධ බල කඳවුරු දෙකට අයත් වූ රටවල් දෙක බැගින් නම් කරන්න.**

මධ්‍යම බලවතුන් ජර්මනිය, ඔස්ට්‍රියාව, තුර්කිය, හංගේරියාව, බල්ගේරියාව

මිත්‍ර පිළ මහා බ්‍රිතාන්‍යය, ප්‍රංශය, රුසියාව, අමෙරිකා එක්සත් ජනපදය

යුද්ධය ආරම්භ වන තෙක් ජර්මන් පිලේ සිටි ඉතාලිය යුද්ධය ආරම්භවීමෙන් පසු මිත්‍ර පිළට සම්බන්ධ විය. **(ලකුණු 02 යි)**

**(iii) යුරෝපය බල කඳවුරු දෙකකට බෙදී ගිය අයුරු පැහැදිලි කරන්න.**

- ❖ බිස්මාක්ගේ රජෝපාය ප්‍රතිපත්තිය අනුව ජර්මනියේ ආරක්ෂාව හා ජර්මනිය යුරෝපයේ බලවත් රාජ්‍යයක් බවට පත්කර ගැනීම සඳහා අනුගමනය කරන ලද ගිවිසුම් ක්‍රමය.
- ❖ ඇල්සාස්-ලොරේන් ප්‍රශ්නය මත ප්‍රංශය තනිකිරීමේ අභිලාෂයෙන් බිස්මාක් ආරම්භ කළ එම ගිවිසුම් ක්‍රමය අනුව යුරෝපයේ ප්‍රබල රටවල් පිල් දෙකකට බෙදී යාම.
- ❖ 1873 දී ජර්මනිය, ඔස්ට්‍රියාව හා රුසියාව සමග එක්වී අධිරාජයන් තිදෙනාගේ සංගමය පිහිටුවීම.
- ❖ පසුව ජර්මනිය විසින් රුසියාව සමග පැවති ගිවිසුම අලුත් නොකිරීම.
- ❖ 1879 දී ජර්මනිය ඔස්ට්‍රියානු-හංගේරියානු අධිරාජ්‍යය සමග ද්විත්ව සන්ධානයකට එළඹීම.
- ❖ 1882 දී ඉතාලිය ද්විත්ව සන්ධානයට එකතු කරගනිමින් ත්‍රෛපාක්ෂික මිත්‍රත්වයක් ගොඩනැගීම.
- ❖ 1794 දී රුසියාව, ප්‍රංශය සමග මිත්‍ර සන්ධානයකට එළඹීම.
- ❖ 1904 දී ප්‍රංශය බ්‍රිතාන්‍යය සමග මිත්‍ර ගිවිසුමකට එළඹීම.
- ❖ 1907 දී රුසියාව ප්‍රංශ-බ්‍රිතාන්‍ය හවුලට එක්වීමෙන් ත්‍රෛයිපාක්ෂික මිත්‍ර සන්ධානය බිහිවීම.

**(ලකුණු 04 යි)**

**(iv) යුරෝපය බල කඳවුරු දෙකකට බෙදීම පළමුවන ලෝක යුද්ධය ඇති වීමට කෙතෙක් දුරට හේතු වී දැයි පරීක්ෂා කරන්න.**

- ❖ නව අධිරාජ්‍යවාදය හේතුකොටගෙන යුරෝපා ජාතීන් අතර හටගෙන තිබූ යටත්විජිත තරඟය.
- ❖ ප්‍රංශ-ජර්මන් වෛරය.
- ❖ ජර්මනිය බලවත් රටක් ලෙස නැගී ඒම හා ජර්මන් විදේශ ප්‍රතිපත්තිය.
- ❖ ජර්මනිය හා එංගලන්තය අතර පැවති නාවික තරඟය.
- ❖ අවි තරඟය.
- ❖ ජාතිකවාදය නැගී ඒම.
- ❖ බෝල්කන් අර්බුදය

පළමුවන ලෝක යුද්ධය ඇතිවීමට තුඩුදුන් මෙම සාධකද සැලකිල්ලට ගනිමින් යුරෝපය බල කඳවුරු දෙකකට බෙදී යාම මෙම යුද්ධය ඇතිවීමට කෙතෙක්දුරට හේතුවීදැයි යන්න පරීක්ෂා කළ යුතුය.

**(ලකුණු 07 යි)**

**8. රුසියාවේ බලය අත්පත් කරගැනීමෙන් පසු බොල්ෂෙවික්වරුන් විසින් 1924 දක්වා ඇති කරන ලද ප්‍රතිසංස්කරණ පරීක්ෂා කරන්න.**

- ❖ 1917 ඔක්තෝබර් විප්ලවයෙන් රුසියාවේ බලය අල්ලා ගැනීමෙන් පසු බොල්ෂෙවික් පාලකයෝ ගැටලු හා අභියෝග ගණනාවකටම මුහුණදුන්හ.
  - මෙතෙක් ලොව කිසිදු තැනක ක්‍රියාත්මක කර නොතිබූ සමාජවාදී වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම (න්‍යායාත්මක).
  - ස්වකීය බලය තහවුරුවන අන්දමේ ආණ්ඩුක්‍රමයක් පිහිටුවාගැනීම.
  - ප්‍රතිවිප්ලවවාදීන්ගෙන් එල්ල වූ විරෝධය හා සිවිල් යුද්ධය.
  - ජර්මනිය සමග සමාදානයක් ඇතිකර ගැනීම.
  - බිඳවැටී තිබූ ආර්ථිකය යළි ගොඩනැගීම
  - 
- ❖ බොල්ෂෙවික්වරු අනුගමනය කළ ක්‍රියාමාර්ගයඃ
  - බොල්ෂෙවික්වරුන්ට රුසියාව තුළ බහුතර බලයක් නොතිබිණි. මේ නිසා ව්‍යවස්ථා සම්පාදක සභාව විසුරුවා හැර කොමියුනිස්ට් පක්ෂයේ මෙහෙයවීමෙන් යුත් ආණ්ඩුවක් පිහිටුවාගැනීම.
  - ජර්මනිය සමග බ්‍රෙෂ්ට්-ලිටොව්ස්ක් ගිවිසුම අත්සන් කොට යුද්ධයෙන් ඉවත්වීම.
  - විදේශ සහායද ලත් ප්‍රතිවිප්ලවය පරාජය කිරීම.
  - ආර්ථිකය ගොඩනැගීම සඳහා පියවර ගැනීම - නව ආර්ථික ප්‍රතිපත්තිය.

**(ලකුණු 14 යි)**

**9. <u>එක්කෝ (A)</u> කොටසට <u>නැතහොත් (B)</u> කොටසට පමණක් පිළිතුරු සපයන්න.**

**(A) (i) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධාන අරමුණු සැකෙවින් දක්වන්න.**

- ❖ ජාත්‍යන්තර සාමය සහ ආරක්ෂාව පවත්වාගෙන යාම.
- ❖ ජාතීන් අතර මිත්‍රත්වය වර්ධනය කිරීම.
- ❖ ආර්ථික-සමාජ-සංස්කෘතික සහ මානුෂික ප්‍රවේශයකින් ප්‍රශ්න විසඳීම.
- ❖ මානව හිමිකම් සහ මූලික අයිතිවාසිකම් තහවුරු කිරීමෙහිලා ජාත්‍යන්තර සහයෝගය ලබාගැනීම.
- ❖ මෙම පොදු අරමුණු සපුරාගැනීම සඳහා ලෝක කේන්ද්‍රයක් ලෙස කටයුතු කිරීම.

**(ලකුණු 05 යි)**

**(ii) එම සංවිධානය එකී අරමුණු සාර්ථක කර ගැනීමට කෙතෙක්දුරට සමත් වී දැයි පරීක්ෂා කරන්න.**

- ❖ එක්සත් ජාතීන්ගේ සංවිධානය මිශ්‍ර සාර්ථකත්වයක් අත්පත් කරගෙන ඇතැයි කිව හැකිය. විශේෂයෙන් සාමය ආරක්ෂා කරගැනීම සම්බන්ධයෙන් එය ඇතැම් අවස්ථාවලදී සාර්ථකත්වයක් අත්පත්කරගෙන ඇත. කොංගෝවේ සිවිල් යුද්ධය, බටහිර නිව්ගිනියාව සම්බන්ධයෙන් ඕලන්දය හා ඉන්දුනීසියාව අතර ඇති වූ මතභේදය වැනි මහා බලවතුන් සෘජුවම සම්බන්ධ නොවූ අර්බුද සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ සාම ප්‍රයත්න සාර්ථක වූ නමුත් මහා බලවතුන්ගේ අභිමතාර්ථ සමග ගැටුන අවස්ථාවල එම සාම ප්‍රයත්න සාර්ථක නොවීය.
- ❖ එක්සත් ජාතීන්ගේ සංවිධානය මැදිහත් වූ කැපීපෙනෙන ලෝක අර්බුද කීපයක් පහත දැක්වේඃ

- 1946 ඕලන්ද පාලනයෙන් නැගෙනහිර ඉන්දියා දූපත්වලට නිදහස ලබාගැනීමට ආධාර කිරීම.
- පලස්තීනය තුළ යුදෙව්වන් හා අරාබීන් අතර ඇති වූ ගැටුම (පූර්ණ සාමයක් ඇතිකිරීමට අසමත්වීම).
- 1950-53 කොරියන් අර්බුදය.
- 1956 සූවස් අර්බුදය.
- 1956 හංගේරියානු ජනතා නැගී සිටීම.
- බෙල්ජියම්-කොංගෝ සිවිල් යුද්ධය.
- සයිප්‍රස් ප්‍රශ්නය
- කාශ්මීර ප්‍රශ්නය
- 1968 චෙකොස්ලෝවෙකියානු අර්බුදය
- 1879 රුසියාව විසින් ඇෆ්ගනිස්ථානය ආක්‍රමණය කිරීම

**(ලකුණු 05 යි)**

**(B) පහත දක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම <u>දෙකක</u> ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.**

**(i) අධිරාජ්‍යයේ ආරම්භය තෙක් රෝමයේ ඇති වූ ආණ්ඩුක්‍රම වෙනස්වීම**

❖ මූලික වෙනස්වීම් තුනකි - රාජාණ්ඩුව (ක්‍රි.පූ. 753 පමණ සිට 510 දක්වා) / සමූහාණ්ඩුව (ක්‍රි.පූ. 510 සිට 27 දක්වා) / අධිරාජ්‍ය පාලනය (ක්‍රි.පූ. 27 සිට 476 දක්වා).

❖ **රාජාණ්ඩුව**

- මුල්ම ආණ්ඩුක්‍රමයයි.
- රජුට පුළුල් බලතල හිමිවීම - ප්‍රධාන පූජක, ප්‍රධාන විනිසුරු හා සියලු නිලධාරීන් පත්කිරීමේ බලය ආදිය
- රජුට පහළින් වැඩිහිටි (සෙනෙට්) සභාව. වැදගත් කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීමේදී රජු මෙම සභාව විමසිය යුතු වීම.
- ඉඩම් හිමි ප්‍රභූන්ට (පැට්‍රිෂියන්වරුන්ට) පමණක් දේශපාලන බලතල හා අවස්ථා හිමිවීම.
- පැට්‍රිෂියන්වරුන් විසින් අවසන් රෝම රජු වූ උඩඟු ටාර්ක්වින් නෙරපා සමූහාණ්ඩුවක් පිහිටුවීම.

❖ **සමූහාණ්ඩුව**

- කලින් රජුට හිමිව තිබූ සිවිල් හා මිලිටරි බලතල කොන්සල්වරුන් දෙදෙනෙකුට පැවරීම.
- ඔවුන්ගේ ධුර කාලය වසරකි.
- එකිනෙකාගේ තීරණවලට එරෙහිවීමේ බලය කොන්සල්වරුන් සතුව පැවතීම.
- විධායක කටයුතුවලදී කොන්සල්වරුන්ගේ සහායට මහේස්ත්‍රාත්වරුන් හා පරිපාලකයන් වාර්ෂිකව පත්කරගැනීම. ඔවුන් පත්කිරීමේ බලය සෙන්චූරියේට් සභාව සතුවීම (එම සභාවේ තීරණ ක්‍රියාත්මක කිරීමට සෙනෙට් සභාවේ අනුමැතිය අනිවාර්ය වීම).
- සෙනෙට් සභාව ආණ්ඩුක්‍රමයේ බලවත්ම අංගය වීම (මූල්‍ය හා විදේශ කටයුතු මෙහෙයවීම). මෙහි සාමාජිකත්වය මුළුමනින්ම පැට්‍රිෂියන්වරුන් සතුවීම.
- පැට්‍රිෂියන් බලයට එරෙහිව දිගු කලක් තිස්සේ සාමාන්‍ය ජනතාව (ප්ලිබියන්වරුන්) ගෙනගිය අරගලයේ ප්‍රතිඵලයක් ලෙස ප්ලිබියන්වරුන්ගේ සභාවක්ද පිහිටුවීම.
- රෝම බලය විශාල ප්‍රදේශයක ව්‍යාප්ත වීම මේ අවධියේදී සිදුවිය.

❖ **අධිරාජ්‍ය පාලනය**
- ක්‍රි.පූ. 27 දී බලයට පත් ඔක්ටේවියස් හෙවත් ඔගස්ටස් රෝමයේ පළමුවන අධිරාජයා වීම.
- අධිරාජයා වෙත සියලු බලතල කේන්ද්‍රගත වීම.
- සෙනෙට් සභාව නාමික තත්ත්වයට පත්වීම.

**(ලකුණු 07 යි)**

**(ii) වැඩවසම් ක්‍රමයේ පිරිහීම**

❖ කුරුස යුද්ධවල අතුරු ප්‍රතිඵලයක් ලෙස වෙළඳාම පුළුල් වී යාම.
❖ ප්‍රවේණිවල අතිරික්තයක් නිෂ්පාදනය ආරම්භ වීම.
❖ වෙළඳ පන්තියක් බිහිවීම.
❖ මුදල් භාවිතය පැතිරියාම.
❖ නගර බිහිවීම.
❖ ඉඩම් බුක්තිය මත පදනම් වූ සේවා සම්බන්ධය දුර්වලවීම.

**(ලකුණු 07 යි)**

**(iii) පෘතුගීසීන් නිරත වූ දේශ ගවේෂණ**

❖ තුර්කි බල ව්‍යාප්තිය හේතුකොටගෙන යුරෝපයේ සිට පෙරදිගට වැටී තිබූ ගොඩබිම් වෙළඳ මාර්ග අවහිර වීම මුහුදු මාර්ග සෙවීමට යුරෝපීයයන් පෙළඹවීම.
❖ පෘතුගාලයේ සමුද්‍රාසන්න පිහිටීම.
❖ නාවික හෙන්රිගේ දායකත්වය (සාග්‍රේස්හි නාවික ශිල්පය පිළිබඳ අධ්‍යාපන මධ්‍යස්ථානය / ක්‍රමානුකූල සිතියම් නිර්මාණය).
❖ වෙළඳ අරමුණු.
❖ කතෝලික දහම ව්‍යාප්ත කිරීමේ අරමුණ.
❖ ප්‍රධාන මුහුදු ගමන්:
- බටහිර අප්‍රිකාවේ ගෝල්ඩ්කෝස්ට් හා කොංගෝ නදියේ මුවදොර තෙක් යාත්‍රා කිරීම.
- බර්තොලමියු දියෙස් සුබ පැත්මේ තුඩුව දක්වා යාත්‍රා කිරීම.
- වස්කෝ ද ගාමා ඉන්දියාවේ කැලිකට් වරායට ගොඩබෑසීම.
- කබ්රාල් බ්‍රසීලයට යාත්‍රා කිරීම.
- බ්‍රසීලයේ බලය පිහිටුවාගැනීම.
- ආසියාවේ ඉතා පුළුල් ප්‍රදේශයක විසිරී ගිය කුඩා ස්ථානවලින් යුත් පෙරදිග අධිරාජ්‍යයක් ගොඩනැගීම.

**(ලකුණු 07 යි)**

**(iv) ~~(iii)~~ 1688 ඉංග්‍රීසි විප්ලවය**

❖ රජු හා පාර්ලිමේන්තුව අතර බලය සඳහා වූ අරගලය.
❖ ස්ටුවර්ට් වාංශික රජවරුන් රජුගේ බලය වර්ධනය කරගැනීමට පාර්ලිමේන්තුව නොතකාහැර කටයුතු කිරීම.
❖ කතෝලිකයන් වූ ස්ටුවර්ට් රජවරුන් හා රෙපරමාදුභක්තික පාර්ලිමේන්තුවාදීන් අතර ආගමික ප්‍රතිවිරෝධතා ඇතිවීම.
❖ පසුබිම:
- 1642 සිවිල් යුද්ධය
- 1649 පළමුවන චාල්ස් රජුගේ හිස ගසා දැමීම
- දෙවන චාල්ස් රජවීම හා ඔහුගේ අත්තනෝමතික පාලනය
- 1688 විප්ලවය

❖ **ප්‍රතිඵල:**

- පාර්ලිමේන්තුවේ අයිතිවාසිකම් තහවුරුවීම.
- රජුගේ බලය සීමාවීම.
- 1689 අයිතිවාසිකම් පනත

**(ලකුණු 07 යි)**

## (v) යුරෝපා සම්මේලන ක්‍රමය

❖ 1815 වියනා සම්මුතියෙන් ඇතිකොටගත් යුරෝපා සාමය පවත්වාගෙන යාම සඳහා මෙම ක්‍රමය ආරම්භ කිරීම.

❖ ඔස්ට්‍රියාව, රුසියාව, ප්‍රශියාව සහ එංගලන්තය මෙම ක්‍රමයේ ආරම්භක සාමාජිකයෝ වූහ.

❖ 1818 අයි-ලා-ෂැපෙල්, 1820 ට්‍රොප්පෝ, 1822 ලයිබැක්, 1822 වෙරෝනා යන සම්මේලනවලදී සමකාලීන යුරෝපයේ විවිධ රටවල මතුව තිබූ කැළඹීලිවලට මැදිහත් වීමට උත්සාහ ගැනීම. උදා: ඉතාලිය, ස්පාඤ්ඤය, ග්‍රීක නිදහස් සටන

❖ සම්මේලන ක්‍රමය අසාර්ථක වූ නමුත් පසුකාලීනව පළමු හා දෙවන ලෝක යුද්ධවලින් පසුව ජාත්‍යන්තර සංවිධාන පිහිටුවාගැනීමේදී මෙම ක්‍රමය ආදර්ශයට ගැනීම.

**(ලකුණු 07 යි)**

## (vi) අන්තර් යුද්ධ සමයේ ආඥාදායක පාලන ක්‍රම

❖ පළමුවන ලෝක යුද්ධයෙන් පසු ඉතාලියේ (ෆැසිස්ට්වාදය - මුසෝලිනී) හා ජර්මනියේ (නට්සිවාදය - හිට්ලර්) නැගී ඒම හා එම පාලනතන්ත්‍රවල ප්‍රධාන ලක්ෂණ පිළිබඳ විග්‍රහයක් මෙහිදී අපේක්ෂා කෙරේ.

❖ පළමුවන ලෝක යුද්ධය මෙන්ම එය අවසානයේදී එළැඹි සාම සමථයත්, යුද්ධයෙන් පසු ඉතාලියේ හටගත් අස්ථාවර දේශපාලන තත්ත්වයත්, යුද්ධයෙන් පරාජය වීම නිසා ජර්මනිය තුළ හටගෙන තිබූ අපකීර්තිය පිළිබඳ හැඟීම, පළිගැනීමේ චේතනාව හා අපේක්ෂාභංගත්වය, ආර්ථික අර්බුදත් මේ රටවල ප්‍රජාතන්ත්‍රවාදය පිරිහීමට හා ආඥාදායක පාලන තන්ත්‍ර නැගී ඒමට තුඩු දුන් අන්දම අවධානයට ලක් කළ යුතු වේ.

❖ **ෆැසිස්ට්වාදයේ හා නට්සිවාදයේ පොදු ලක්ෂණ:**

- අන්තගාමී ජාතිවාදය - තම ජාතිය අන් ජාතීන්ට වඩා උත්තරීතර යයි සලකන ලද අතර, රජයේ ශ්‍රේෂ්ටත්වය අවධාරණය කිරීම.
- අධිපතිවාදී ආණ්ඩුක්‍රමය - රජයේ අභිමතාර්ථය පුද්ගලයාගේ අභිමතාර්ථවලට වඩා වැදගත් ලෙස සැලකීම, පුද්ගල සමාජ ජීවිතය රජය විසින් මුළුමනින්ම පාලනය කරනු ලැබීම. පුද්ගල නිදහස සීමා කිරීම.
- තනි පක්ෂ ක්‍රමය - ප්‍රජාතන්ත්‍රවාදයට තැනක් හිමි නොවූ අතර කොමියුනිස්ට්වාදයට අතිශයින් විරුද්ධ වීම. නායකත්ව වන්දනයක් පැවතීම.
- ආර්ථික ස්වයංපෝෂිතභාවයක් සාක්ෂාත් කරගැනීමට වෙහෙසවීම. ආණ්ඩුව විසින් ආර්ථික කටයුතු පාලනය කරනු ලැබීම.
- හමුදා බලය හා ප්‍රචණ්ඩත්වය. විරුද්ධවාදීන් හා විවේචකයන් ප්‍රචණ්ඩ ලෙස මර්දනය කිරීම.
- යුද්ධය උත්කර්ෂයට නැගීම හා ආක්‍රමණකාරී විදේශ ප්‍රතිපත්තිය.

**(ලකුණු 07 යි)**

****

PAST PAPERS WIKI
WWW.PastPapers.WIKI



Past Papers Wiki - Download More Past Papers and Study Well!